## බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.09.30

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා.
06. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී යූ.එච්. ගාමිණී මැතිතුමා

**සහභාගීනොවූවෝ:-**

01. ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර ලේකම්

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා ලේකම් මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ එතුමා , මෙම වර්ෂය තුළ මග නැගුම ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 60 ආසන්න මුදලක් මෙම සභාව වෙත ලැබුණු බව දැන්වීය. එම මුදල් උපයෝගී කරගෙන සංවර්ධන වැඩ කටයුතු රැසක් ඉටුකල අතර , එම ව්‍යාපෘතිය යටතේ මාර්ග 04 ක් සංවර්ධනය කිරීම සඳහා ද මුදල් ප්‍රතිපාදන ලැබුණු බැවින් මේවන විට මාර්ග 03 ක වැඩ ආරම්භකර ඇති අතර , එක් මාර්ගයක පිළිගත් සමිතියක් වෙත පවරා ඉටුකරගැනීමට කටයුතු කර ඇති බැව් පැවසීය.

වැඩිදුරටත් කථා කල ගරු සභාපතිතුමා , මහා මාර්ග නියෝජ්‍ය අමාත්‍ය නිර්මල කොතලාවල මැතිතුමා විසින් කුඩා පාලම ඉදිකිරීම සඳහා පළාත් පාලන ආයතන නියෝජිතයින් වෙත ලබන ජනවාරි මාසයේ දී මුල්‍ය ප්‍රතිපාදන වෙන්කර දෙන බැව් සදහන් කල බවත් , ඉරිදා පොළ ඉතා ඉක්මණින් ජනතා අයිතියට පැවරීමට අදහස් කර ඇති නිසා දොරවෙල ඔය හරහා පොළට පිවිසීම සඳහා පාලමක් ඉදිකිරීමට මුදල් ලබාදෙන ලෙස එතුමා වෙතින් කල ඉල්ලීමකට අනුව ඒ සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කර ලෙස දැණුම් දුන් බවත් , ඒ අනුව ඉතා ඉක්මණින් අදාළ ඇස්තමේන්තුව සකස්කර එතුමා වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බවත් දැන්වීය.

ගම නැගුම හා නගර සභා මුදල් යොදවමින් විශාල සංවර්ධන වැඩ කොටසක් මෙම වර්ෂය තුළ නිම කිරීමට හැකි වූ අතර , මාර්ග 09 ක වැඩ අවසන් කර ජනතා අයිතියට පත්කර ඇති බැව්ද සඳහන් කරන ලදී.

පසුගිය දා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධිකරණ රැස්වීමට සහභාගී වූ අතර , එතුමා රත්නපුර දිස්ත්‍රික්කයේ අඩුපාඩු හා සංවර්ධන ක්‍රියාවලිය සම්බන්ධව රාජ්‍ය නිලධාරීන් හා දේශපාලන නායකයින් දැනුවත් කිරීමට පියවර ගත් අතර , ඉදිරියේ දී රත්නපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන සඳහා විශාල මුදලක් වෙන්කර දෙනු ලබන බැව්ද සදහන් කරන ලදී. එසේම ආර්ථික සංවර්ධන ප්‍රවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා ද , පසුගිය දා රත්නපුර දිස්ත්‍රික්කයේ අඩුපාඩු සොයා බැලීමට පැමිණි බවත් , එතුමා ද දිස්ත්‍රික්කයේ සංවර්ධන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීමට එකග වූ බව දැන්වීය. ඒ අනුව ඉදිරියේ දී මෙම නගර සභාවට සංවර්ධන කටයුතු වෙනුවෙන් විශාල මුදල් සම්භාරයක් ලැබෙනු ඇතැයි පැවසීය.

තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා , පසුගිය දා 18 වන ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ දී සම්මත වූ බවත් , එය සම්මත කිරීම සඳහා පක්ෂ විපක්ෂව ඡන්ද ප්‍රකාශ කල පාර්ලිමේන්තු ගරු මැති ඇමතිවරුන්ට බලන්ගොඩ නගර සභාවේ ස්තුතිය පළකරන අතර , අතිගරු ජනාධිපතිතුමාට තවත් වසර 20 කට වඩා වැඩි කාලයක් මේ රට පාලනය කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවා යි සුභාශිංසනය පළකරන බව දැන්වීය.

2011 වර්ෂය තුළ ජනතාවට ඉතා හොඳ සේවයක් සැලසීම සඳහා අයවැය සකස් කිරීමේ කාර්යය සිදුකරගෙන යන බැව් දන්වමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**(03) 2010.08.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2010.08.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**(04) පසුගිය සභා වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:

05:01 ජාතික කියවීමේ මාසය - 2010 ඔක්තෝබර්

බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාල උපදේශක කමිටුව විසින් ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පහත සඳහන් ක්‍රියාකාරකම් හා වැඩ සටහන් පැවැත්වීමට අදහස් කර ඇති බැවින් , ඒ සඳහා රු.25,000/- ක මුදලක් වෙන්කර දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති 2010.09.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- **i.** 010.09.16 සිට 21 දක්වා ජාතික කියවීමේ මාසයට සමගාමීව පුස්තකාල කියවීම් ශාලාවේ දී එම්.ඩී.ගුණසේකර සහ සමාගම අනුග්‍රහයෙන් පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම.
- **ii.** 2010 ඔක්තෝබර් මාසයේ දී දෙමළ පොත් ප්‍රකාශකයකු අනුග්‍රහයෙන් දෙමළ පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම
- **iii.** බැනර් මගින් ජනතාව දැනුවත් කිරීම.
- **iv.** පුස්තකාල පාඨක සමාජය මගින් ප්‍රකාශයට පත්කරන ලද මහිමය සඟරාව එළිදැක්වීම.
- **v.** පුස්තකාලයේ ළමා අංශය විවෘත කිරීම.
- **vi.** ජංගම පොත් එකතුව මගින් පුස්තකාලය සඳහා පොත් ලබාගැනීම
    - ශබ්ද විකාශන මගින් දැනුම් දී පසුව එකතු කිරීම.
    - පොස්ටර් හා අත් පත්‍රිකා මගින් දැනුවත් කිරීම.
    - ප්‍රභූන්ගෙන් හා විශ්‍රාම ගිය විද්වතුන්ගෙන් ඉල්ලීම් කිරීම
    - දුර්ලභ ගනයේ පොත් ලබාගැනීම
    - පරිත්‍යාගශීලීන්ගෙන් ලිපි මගින් ඉල්ලීම් කිරීම
- **vii.** සාහිත්‍ය තරඟ පැවැත්වීම ( පාසැල් සිසුන් සඳහා )
    - සාහිත්‍ය තරඟ පැවැත්වීම
    - පෝස්ටර් චිත්‍ර නිර්මාණය
- **viii.** අධ්‍යාපන සම්මන්ත්‍රණය
- **ix.** රත්නපුර දිස්ත්‍රික් කවි කිවිදියන්ගේ කවි හමුව 2010.10.19 වන දින සවස 4.00 ට නගර සභා පෙර පාසලේ දී.
- **x.** තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය පිළිබඳ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන - විද්‍යුත් පුස්තකාලයේ දී.
- **xi.** පුස්තකාල සඳහා පොත් මිළදීගැනීම.
- **xii.** පුස්තකාල පාඨක සමාජය ප්‍රතිසංවිධානය කිරීම හා පාඨක සමාජ අරමුදලක් පිහිටුවීම.
- **xiii.** නගර සභාවට අයත් පෙර පාසල් 02 හි සිඟිති දරුවන් සඳහා කථා පැය පැවැත්වීම.
- **xiv.** ඉවත් කරන ලද පොත් පරිත්‍යාග වශයෙන් ලබාදීම
- **xv.** සමාප්ති උළෙල හා තෑගි බෙදාදීම

මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමටත් , ඒ සඳහා සභා මුදලින් වියදම් දැරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී. විශිෂ්ඨ සේවයක් ඉටුකල ගුරු දෙපළකට ( රත්නායක මහතා සහ එම මැතිණිය ) උපහාර දැක්වීම ද මේ යටතේ සිදුකිරීම සුදුසු යැයි ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව සභා සම්මත විය.

05:02 බලන්ගොඩ පොදු වෙළඳැල අංකඃ 16 දරණ එළහරක් මස් කඩය
ටෙන්ඩර් කිරීමකින් තොරව ලබාගැනීම

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති බලන්ගොඩ , මිරිස්වත්ත, කහටපිටිය යන ලිපිනයේ පදිංචි අංකඃ 43 දරණ ලිපිනයේ පදිංචි එම්.ආර්.එම්.ඉම්රාන් මහතා විසින් ඉදිරිපත් කරඇති 210.09.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

01. දැනට ඇති ගෝ ඝාතකාගාරය වෙනත් අයෙකුට අයත් වන බැවින් ,එහි සේවය ලබාගැනීමට නොහැක.
02. දැනට සතුන් ප්‍රවාහනය සඳහා අවසර ලබානොදීම.

ඉහත කරුණු සලකා බලා මෙම ගවමස් කඩය ටෙන්ඩර් කිරීමකින් තොරව ලබාදෙන ලෙස ඉල්ලා තිබිණ.

චක්‍රලේඛය පරිදි මස්කඩ ටෙන්ඩර් කිරීම කලයුතු බැවින් ටෙන්ඩර් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 පෙර පාසල් පාලිකා තනතුරු අනුමත නොකිරීම:

ඉහත සඳහන් කරුණට අදාලව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති අංක:සීඑල්ජී/332 හා 2010.08.31 දිනැති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා සභාගත කරන ලදී.

ස්ථිර පදනමින් පෙර පාසල් පාලිකා තනතුරු නැවත අනුමත නොකිරීමට හා දැනට සේවයේ යෙදී සිටින පෙර පාසල් පාලිකාවන් විශ්‍රාම යාමත් සමඟ එම තනතුරු අහෝසි කිරීමට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය සහ පළාත් පාලන ආයතන ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවයකට පත්ව ඇති බව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක:DMS/DS/97/27/02 හා 2010.07.30 දිනැති ලිපියෙන් දැණුම් දී ඇති බැවින් , ඒ අනුව දැනට අනුමත පෙර පාසල් පාලිකා තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවාගෙන ඇති පෙර පාසල් පාලිකාවන් විශ්‍රාම යාමෙන් පසු එම තනතුරු අහෝසි තනතුරු වශයෙන් සලකා කටයුතු කරන ලෙස එමගින් දන්වා තිබිණ.

09:04 සම්පත් පියසට වාණිජ මධ්‍යස්ථානයක් ලෙස දියුණු කිරීම :

බලන්ගොඩ , බලගහමුල දැනට ක්‍රියාත්මක වන " සම්පත් පියස " වාණිජ ව්‍යාපෘතියක් ලෙස දියුණු කිරීම කර එහි එක් කාමරයක් ව්‍යාපාරික ස්ථානයක් ලෙස සංවර්ධනය කර එහි පොහොර බෑග් ,කෘෂි උපකරණ , ඇට වර්ග , පැළ වර්ග හා රසායන ද්‍රව්‍ය අලෙවිකිරීමේ කුටියක් පවත්වාගෙන යාම සුදුසු යැයි ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

05:05 පාසැල් සම්පත් කේන්ද්‍ර විවෘත කිරීම:

ඉහත සඳහන් කරුණට අදාලව ඉදිරිපත් කර ඇති 2010.09.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පාසල් සම්පත් කේන්ද්‍ර වැඩ සටහන යටතේ දැනට වැඩනිමකර ඇති පහත සඳහන් පාසැල් වල සම්පත් කේන්ද්‍ර ගරු පරිසර අමාත්‍යතුමන් හා ගරු ප්‍රධාන අමාත්‍යතුමන් සහභාගීකරවාගෙන 2010.10.21 වන දින විවෘත කිරීම සුදුසු වන අතර එම මධ්‍යස්ථාන 05 සඳහා පහත සඳහන් භාණ්ඩ ලබාදෙන ලෙසත් , ඒ සඳහා වැය වන මුදල පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරගත හැකි බවත් එමගින් දන්වා තිබිණ.

01. බිම් තරාදි 05
02. මුදල් සේප්පු 05

අදාළ කාර්යයන් සිදුකිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී. ඉහත උපකරණ වලින් බිම් තරාදි වෙනුවට කිලෝ 25 ඉලෙක්ට්‍රොනික් තරාදි 05 ක් මිළදී ගැනීමට ද සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 **කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සේවය සඳහා සේවා ගිවිසුමකට යටත්ව කම්කරුවන් සේවයේ යොදවා ගැනීම:**

කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු සඳහා දැනට සිටින සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන නිසා , සේවා අවශ්‍යතාව මත කම්කරු 20 දෙනෙකු සේවයට යොදවාගත් අතර , සේවා ගිවිසුමකට යටත්ව ඔවුන් සේවයේ යෙදවීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

සේවා ගිවිසුම් සකස් කර ඔවුන් සේවයේ යොදවා ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **අංකඃ 2908 දරණ නඩුව ඉල්ලා අස්කරගැනීම :**

බළන්ගොඩ නගර සභාව විසින් බළන්ගොඩ සිංහ සමාජය වෙත පවරා ඇති නඩු අංකඃ 2908 සිද්ධියට අදාළ ගිනි නිවන රථය බළන්ගොඩ නගර සභාවට ලැබී ඇති බවත් , මෙම ගිනි නිවන රථය ගෙන්වීමේ දී සිදුවූ විශ්වාසය කඩවීමත් මත ඉහත නඩුව පැවරූ අතර , බළන්ගොඩ සිංහ සමාජයේ සම්පූර්ණ වියදමින් මේ වන විට ගිනි නිවන රථය නගර සභාව වෙත පරිත්‍යාග කල බැවින් , ඉහත සඳහන් නඩුව ඉල්ලා අස්කර ගැනීම සුදුසු බව යෝජනා කරමින් ගරු සභාපතිතුමා විසින් ලිපියක් සභාගත කරන ලදී.

එම නඩුව ඉල්ලා අස්කරගැනීමටත් අත්තිකාරම් පියවීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **ගෝසාතක ස්ථානය සඳහා 2011 වර්ෂයට බලපත්‍ර ලබාගැනීම:**

බළන්ගොඩ , කහටපිටිය පාර අංකඃ 50/54 දරණ ස්ථානයේ ඩී.එම්.පජීල් යන අය විසින් පවත්වාගෙන යනු ලබන ගෝසාතකාගාරය සඳහා 2011 වර්ෂයට බලපත්‍රක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඒ මහතා විසින් ඉදිරිපත් කර ඇති 2010.09.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පරිසර බලපත්‍රය සහිතව විරෝධතා කැඳවා ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **මුරකරුවකු බඳවා ගැනීම :**

බළන්ගොඩ බස්නැවතුම්පලෙහි නිරන්තරව අක්‍රමිකතා සිදුවන බැවින් , අඛණ්ඩ මුර සේවයක් පවත්වාගෙන යාම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

තාවකාලික මුරකරුවෙකු ලෙස සේවයට යොදවාගත් චමින්ද තුසිත කුමාර යන අයගේ සේවය අසතුටුදායක බැවින් , සේවා ගිවිසුම් අවලංගු කර හෙයින් , සේවා අවශ්‍යතාව අනුව මුරකරුවෙකු හා පණිවුඩකරුවෙකුබඳවාගත යුතු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

අයදුම්පත් කැඳවා මුරකරුවෙකු හා පණිවුඩකරුවෙකු බඳවා ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

5:10 **2011 වර්ෂයට ලංසු කැඳවීම - පොදු වෙළඳසැල මස් කඩ හා නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම**

බළන්ගොඩ නගර සභා පොදු වෙළඳසැලෙහි අංකඃ 15,16 හා 17 දරණ මස් කඩ 2011 වර්ෂයට බදුදීම සහ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු කිරීමේ සේවා බදුදීම සඳහා 2011 වර්ෂයට ලංසු කැඳවීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ පිළිබඳව සලකා බැලූ සභාව ඉහත සඳහන් සේවාවන් පවත්වාගෙන යාම සඳහා දැනට පවතින මිළ ගණන් අවම ලංසුව ලෙස සලකා 2011 වර්ෂයට ලංසු කැඳවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**5:11 පළාත් පාලන ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම:**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවා ඇති අංක: OLC/LO/LAA/SBGP8 හා 2010.09.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව , එක් පුවත්පත් දැන්වීමක් පවා පළකිරීම සඳහා සභාවට විශාල මුදලක් වැය කිරීමට සිදුව ඇති බැවින් සභාවේ මූල්‍යමය තත්ත්වයට විශාල බලපෑමක් සිදුවන බව සභාවේ මතය විය. එබැවින් , භාෂාත්‍රයෙන්ම දැන්වීම් පළකිරීමට හැකියාවක් නොමැති බවත් බැවින් එක් භාෂාවකින් පමණක් දැන්වීම් පළකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**5:12 ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන ඉලක්ක කරගෙන පවත්වනු ලබන විදේශ පුහුණු වැඩ සටහන් :**

ඉහත සඳහන් කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති අංක: CLG හා 2010.09.23 දිනැති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා සභාගත කරනලදී.

පළාත් පාලන ආයතන වෙත විවිධ පෞද්ගලික සංවිධාන හා ආයතන විසින් රජයේ හෝ පළාත් සභාවන්හි අනුමැතියකින් තොරව විවිධ විදේශ චාරිකා සහ පුහුණු වැඩ සටහන් සංවිධානය කරන බව වාර්තා කර ඇත. එවැනි විදේශ චාරිකා හෝ පුහුණු වැඩ සටහන් සංවිධානය කරනු ලබන ආයතන විසින් පළාත් පාලන ආයතන ප්‍රධානීන් , නියෝජ්‍ය ප්‍රධානීන් සහ සභිකයන් නොමඟ යවමින් පළාත් පාලන ආයතනයන්හි මුදල් රාජ්‍ය ප්‍රතිපත්ති වලට පටහැනි ලෙස ලබාගැනීමේ ඡාවාරමක් පවතින බව හෙළි වී ඇති බැවින් , රජයේ නිලධාරීන්ගේ විදේශ ගමන් සඳහා අනුමැතිය ලබාගැනීමේ දී ජනාධිපති ලේකම්තුමාගේ අංක: සී.එස්.ඒ/1/1/2006 හා 2006.02.10 වන දිනැති චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කල යුතු බව එමගින් පෙන්වා දී තිබුණි.

**05:13 ස්තූතිය පුදකිරීම :**

බලන්ගොඩ නැණසල ආයතනය විසින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහනක් 2010.08.28 වන දින පෙ.ව.09.00 සිට ප.ව.01.00 දක්වා කාලය තුළ බස්නැවතුම්පලෙහි සිදුකල අතර , එම කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය කොඩි කණු ලබාදෙමින් දක්වන ලද සහයෝගයට ස්තූතිය පළකරමින් නැණසල ආයතනයේ අධ්‍යක්ෂ විසින් එවා ඇති ලිපියක් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**05:14 කිරිඳිගල ජල ටැංකිය අසල මාර්ගය**

ඉහත සඳහන් මාර්ගය පුළුල්කර සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා බලන්ගොඩ , කිරිඳිගල " ඉන්ද්‍රා සෙවන " යන ලිපිනයේ පදිංචි ගීතානි ජයන්ති මහත්මිය විසින් ඉදිරිපත්කර ඇති 2010.09.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මාර්ගය සංවර්ධනය කරදීමටත් , ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සබරගමුව පළාත් සෞඛ්‍ය , දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය භානු මුණිප්‍රිය මැතිතුමා වෙතින් වෙන්කරවා ගැනීම සහ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීමේ කාර්ය ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා වෙත පැවරීමටත් , ඊට අදාළ ඇස්තමේන්තුව නගර සභාව මගින් සකස් කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:15 **2010 වර්ෂය සඳහා වීථි පහන් නඩත්තු කිරීම :**

2010 වර්ෂයේ වීථි පහන් නඩත්තුව සඳහා දළ වශයෙන් රු.287770/- ක මුදලක් වැය වී ඇති බව දන්වමින් ඉදිරිපත් කර ඇති 2010.09.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

අදාල මුදල විදුලි බල මණ්ඩලයෙන් අයකරගැනීමට සභාවේ අවධානය යොමුකරනලදී.

05:16 **2011 වර්ෂයට වරිපනම් පැනවීම :**

ඉහත සදහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

2011 වර්ෂය සඳහා නව තක්සේරු ප්‍රතිශෝධනය මෙතෙක් ලැබී නොමැති නිසා 2010 වර්ෂයේ ක්‍රියාත්මක කල වාර්ෂික වටිනාකම් වලට අනුව වරිපනම් අයකිරීමට එමගින් අනුමැතිය ඉල්ලා තිබිණ.

255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 238 වන වගන්තියේ (1) උප වගන්තියෙන් නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත (අලුතින් එක්වූ ප්‍රදේශ හැර) පිහිටි සියළුම නිවාස වල , ගොඩනැගිලිවල , ඉඩම්වල හා ගෙපත්වල 2010 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2011 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත් ,

එකී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් -

(අ) නේවාසික ස්ථාන මත සියයට හතර ( 4% ) ක වරිපනමක් ද ; සහ

(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට පහ (5%) ක වරිපනමක් ද ,

2011 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් සහ ඒ වරිපනම්, එකී නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥා පනතේ 230 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31 , ජුනි 30 , සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවල දී අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් එම යෝජනාව සභා සම්මත විය.

05:17 **2011 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම :**

නගර සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ බළන්ගොඩ නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බළන්ගොඩ නගර සභාව විසින් 2011 වර්ෂය තුලදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමඟ කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනා ගරු නාගරික මන්ත්‍රී, එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් එම යෝජනාව සභා සම්මත විය.

| 1 වන තීරුව | | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් 750 නොඉක්මවන අවස්ථාවක | 750 ට වැඩි එහෙත් 1.500 නොඉක්මවන අවස්ථාවක | 1,500 ඉක්මවන අවස්ථාවක |
| 01. | නවාතැන් පලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 02. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. | හෝටලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 04. | බේකරියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. | බාබර් සාප්පුවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 06. | ගෝසාතනාගාරයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 07. | භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 . | බත් කඩයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. | ලොන්ඩරියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | කිරිපට්ටියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | මස් හෝ මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |

05:18 **2011 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම:**

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165අ වන වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් , එම උප ලේඛනයේ 11 වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් , එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2011 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කල අතර , එම යෝජනාව , ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

## උපලේඛනය

| 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|
| අනු අංකය / කර්මාන්තයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්<br>750 නොඉක්මවන අවස්ථාවක | 750 ට වැඩි එහෙත් 1.500 නොඉක්මවන අවස්ථාවක | 1,500 ඉක්මවන අවස්ථාවක |
| 01. කුෂන් වැඩ කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 02. ගීත පටිගත කිරීම හෝ තැටිගත කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 03. ඇස් කණ්නාඩි විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04. දැව ඉරුම් පට්ටලයක් (ලී මෝලක්) පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 500'00 | 750'00 | 1000.00 |
| 06. පොල්තෙල් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 07. ස්වර්ණාභරණ නිපදවීම හා/හෝ විකිණිම | | | 1000.00 |
| 08. මුද්‍රණාලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. බයිසිකල් හා/හෝ බයිසිකල් අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. පින්තූර රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. ටයර් හෝ ටියුබ් විකිණීම හා/හෝ වොල්කනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරිම හා/හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. කම්මලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. මැටිභාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 15. උළු අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. සිමෙන්ති ගඩොල් නිපදවීම හා/හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 19. ලී බඩු අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. මිනීපෙට්ටි විකිණීම හා/හෝ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. බ්රේක් ලයිනර් විකිණීම හා/හෝ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 22. ජල පොම්ප අමතර කොටස් අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 23. ජංගම දුරකථන අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. ටයිල් අලෙවිකිරීම හා/හෝ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 25. වාහන අමතර කොටස් අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 26. ඇළුමිණියම් භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. පපඩම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 28. වීදුරු භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 29. පිත්තල භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 30. ඇඹරුම්හලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 31. වී මෝලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 32. මැණික් කැපීම හා ඔපදැමීමේ ස්ථානයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 33. ලී වෙළඳසැලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 34. ලියවන පට්ටලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 35. ගමන් මලු හෝ පාවහන් සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 36. සත්ව ආහාර අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 37. කොන්ක්‍රීට් නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 38. පාවහන් අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 39. දිය ලුණු පැකට් කිරීම | 500.00 | 750.00 | 1000.00 |

05:19 **2011 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම:**

255 වන නගර සභා ආඥාපනතේ 165ආ වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165අ වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2011 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම , එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් , බද්දට යටත් සෑම තැනැත්තකුම එකී ව්‍යාපාර බද්ද 2011 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර බලන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

උපලේඛනය

| | 1 වන තීරුව<br>බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | 11 වන තීරුව<br>ගෙවිය යුතු බද්ද<br>රු. ශත |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට | 90.00 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180.00 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360.00 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට | 1,200.00 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000.00 |

05:20 **මිරිස්වත්ත ගුණානන්ද මාවත ඉතිරි කොටස සංවර්ධනය කිරීම:**

මිරිස්වත්ත ගුණානන්ද මාවතේ අඩි 60 ක පමණ කොටස හා පැති බැම්ම ඉදිකරදෙන ලෙස ඉල්ලා ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

සභා අරමුදල් යොදවා සකස් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:21 **නගරයේ වෙළඳසැල් හිමියන් තුළ පැන නැඟී ඇති ගැටළුව :**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ වරිපනම් බදු ගෙවන්නන්ගේ සංගමයේ ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නගරයේ වෙළඳසැල් හිමියන්ට පැන නැඟී ඇති ගැටළු සහ ඊට අදාළ යෝජනා ඉදිරිපත් කරමින් ඒ කෙරෙහි අවධානය යොමුකරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ගැටළු :

01. වෙළඳසැල් වලින් ඉවත් කරන කුණු කසල නගර සභාවේ ට්‍රැක්ටරය පැමිණෙන තෙක් වෙළඳසැල් ඉදිරිපිට තැබීම නිසා එම වෙළඳුන් පොලීසිය විසින් බන්ධනාගාරගත කොට නඩු පැවරීම.
02. ලොරි වලින් බඩු බෑම සඳහා දවසේ වරු ගණන් දිවා කාලයේ දී වෙළඳසැල් දොරටු අවහිර වන ලෙසට දොරටු ආවරණය කරමින් දිවා කාළය පුරා ලොරි නතර කොට තිබීම.
03. වීදිය දෙපස පදික වේදිකා තැනීමට වෙළඳුන් විසින් පරිත්‍යාග කරනු ලැබූ බිම් තීරුව සම්පූර්ණයෙන්ම අවහිර වන ලෙසට රථ වාහන වල මුහුණ කොටස නවතා තැබීමෙන් පදික වේදිකාව අවහිර කිරීම.
04. කතරගම කෝවිල අසල සිට පත්තිනි කෝවිල දක්වා වීදියෙහි එකම පැත්තක දිනපතාම වෙළඳසැල් දොරටු සම්පූර්ණයෙන්ම අවහිර වන ලෙසට සහ ආවරණය වන ලෙසට රථවාහන නතර කිරීම.
05. වීදිය දෙපස පදික වෙළඳුන් ඉවත් කරනු ලැබුවාවට පසු වීදිය දෙපස හෝ මාර්ගයේ රථ වාහන නතර කර ඒවායේ සිට වෙළඳාම් කිරීම.

යෝජනා :

01. නගර සභාවේ ට්‍රැක්ටරයක් පැමිණෙන තෙක් කුණු කසල භාජන වෙළඳසැල් ඉදිරිපිට කෙළවරයක තබාගැනීමේ අවසර ලබාදීම.
02. සියළුම රථ වාහන සහ වෙළඳ වාහන ක්‍රීඩාපිටිය පැත්තේ මාර්ගයෙහි එක් පැත්තක නතර කරවීම
03. ලොරි වලින් බඩු බෑම සහ පැටවීම රාත්‍රී කාලයේ දී කිරීමට උපදෙස් ලබාදීම.

මේ සම්බන්ධව සාකච්ඡාවක් සියළුම වෙළඳසැල්හිමියන් , පොලීසිය හා වෙළඳ සංගමයේ සහභාගීත්වයෙන් 2010.10.02 වන දින ප.ව.3.00 කොම්පෝස්ට් ව්‍යාපෘතියේ දී සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:21 **ලෝක ළමා දිනය සැමරීම:**

ලෝක ළමා දිනය නිමිති කරගෙන නගර සභා පෙර පාසලේ දරුවන් සඳහා මැජික් සංදර්ශණයක් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් ගරු සභාවේ දැනගැනීම පිණිස සභාගත කරන ලදී.

05:22 **වැලි සැපයීම :**

2010 වර්ෂයේ ඉතිරි කාල පරිච්ඡේදය සඳහා ප්‍රවාහනය සමග වැලි කියුබ් 01 ක් රු.6000/- ක මුදලකට සැපයිය හැකි බව දන්වමින් බළන්ගොඩ , කිරිඳිගල , අංක: 62 යන ලිපිනයේ පදිංචි ජී.ඩබ්.ඉන්ද්‍රලාල් යන අය විසින් ඉදිරිපත් කර ඇති 2010.09.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වැලි කියුබ් එකක් රු.5000/- ක මුදලකට ලබාදෙන ලෙසත් , ඒ සඳහා එකගවන්නේ නම් පමණක් ඉහත සඳහන් අයගෙන් වැලි මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:23 මහජන සෞඛ්‍ය පරීක්ෂක ඩිප්ලෝමා පාඨමාලාව 2010-2011 ඝන අපද්‍රව්‍ය කළමණාකරනය**

බළන්ගොඩ නගර සභාම මගින් පවත්වනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පාඨමාලාව මහජන සෞඛ්‍ය පරීක්ෂක ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන්ට ඉතා ඵලදායී වන අතර, ලබන මස පැවැත්වීමට නියමිත පාඨමාලාව 2010.10.21,22 හා 23 පැවැත්වීමට සැලසුම් කරන ලෙස ඉල්ලමින් කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් එවා ඇති 2010.09.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉල්ලා ඇති දිනයන්හි අදාල පාඨමාලාව පැවැත්වීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:22 කුඹුර අද්දර පාර සම්බන්ධවයි :**

ඉහත සඳහන් මාර්ග සකස් කිරීමේ පළමු අදියර නිම කිරීම සම්බන්ධව ස්තුතිය පළකරමින් එහි දෙවන අදියර ලෙස පැති බැම්ම සහ මාර්ගය කොන්ක්‍රීට් කරදෙන ලෙස ඉල්ලා , බළන්ගොඩ රාස්සගල පාර, අංකඃ 10/134 දරණ ලිපිනයේ පදිංචි ජී.ආර්.ජයතිලක මහතා විසින් එවා ඇති 2010.09.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එම මාර්ගය සහ පැති බැම්ම සකස් කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව සභා සම්මත විය.

**05:23 බළන්ගොඩ,මුගුණමලේ නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන ඇති ඉඩම හරහා පාරක් පුළුල් කරගැනීම සඳහා අනුමැතිය ලබාදීම**

ඉහත සඳහන් කරුණට අදාළව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එවා අංකඃ 10/2/898 හා 2010.09.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වන්දි මුදල් ගෙවා රජයට අත්කරගනු ලැබූ අවසාන ගම් පිඹුරු අංකඃ 481 හි දැක්වෙන ඉඩම හරහා බළන්ගොඩ මුගුණමලේ පොල්වත්ත පදිංචි බී.එම්.බියට්‍රිස් මහත්මියගේ පෞද්ගලික ඉල්ලීම මත අඩි 20 ක මාර්ගයක් ලබාදීම මෙම අධිකාරියේ අනුමැතියක් හෝ එකගතාවයක් නොමැතිව බළන්ගොඩ නගර සභාව විසින් නිර්දේශ කර තිබුණ ද නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සැලසුම් කර ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉහත කී ඉඩමෙන් පෞද්ගලික ඉඩම් සඳහා මාර්ග ප්‍රවේශකත්වයක් ලබාදීමට හැකියාවක් නොමැති බැව් එමගින් දන්වා දන්වා තිබිණ.

මැණුම්පත්‍රය මගින් මාර්ගය වෙන්කර ඇති බැවින් , මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා එම මාර්ගය වෙන්කිරීමට තීරණය කරනු ලැබූ බව දැන්වීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:24 කසල එකතු කිරීමේ ටෙන්ඩරයේ කාලය දීර්ඝ කිරීමඃ**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති 2010.09.28 දිනැති ලිපිය සභාගත කරන ලදී. බළන්ගොඩ නගරයේ කුණු කසල එකතු කිරීම සඳහා බී.ගුණරත්න යන අය සමග ඇතිකරගත් ගිවිසුම 2010.09.30 දිනෙන් අවසන්වේ, 2011 වර්ෂයට මෙම සේවාව වඩාත් විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා අයවැය මගින් මුදල් වෙන්කර ජනවාරි 01 දිනට ලංසු පිරිනැමීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

ඉදිරි මාස 03 සඳහා ද ගිවිසුම්ගත මුදලට මෙම සේවාව පිළිගත් ලංසුකරු වෙත පවරා ඉටුකරගැනීම සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

01. 2010 වර්ෂයේ ඇස්තමේන්තු කරඇති අයවැය නොඉක්මවන පරිදි කටයුතු කිරීමට හැකිවීම.

02. 2011 වර්ෂය සඳහා අලුතින් ඇස්තමේන්තුවක් සකස් කර නව කසල කළමනාකරණ සැලැස්මක් ඇතිකිරීම.

03. ඉදිරි මාස 03 සඳහා ඇස්තමේන්තුව වැඩිකිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම.

04. දැනට ස්ථිර තනතුරු සඳහා මු.රෙ.අනුමැතියට යවා ඇති අතර , ඒ අනුව නගර සභාව විසින් කලහැකිවීම.

05. සාමාන්‍යයෙන් ගිවිසුම් කාලය වසරක්වීම හා එය දෙසැම්බර් 31 දිනෙන් අවසන්වීම වඩාත් විධිමත්වීම.

06. දැනට සිටින ටෙන්ඩර්කරු මගින් එම මුදලටම කරගත හැකිවීම

ගිවිසුම්ගත කාලය ඉදිරි මාස 03 සඳහා දීර්ඝ කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලද අතර , කසල ඉවත් කිරීමේ සේවාව අධීක්ෂණය කර ඒ සඳහා වැය වන මුදල සම්බන්ධ වාර්තාවක් ලබාදෙන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වෙත උපදෙස් ලබාදීමත් , රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම ආදායම් පරීක්ෂක මහතා ලවා අධීක්ෂණය කර වාර්තාවක් සපයන ලෙස උපදෙස් ලබාදීමටත් සභාව තීරණය කරන ලදී.

**05:25 බළන්ගොඩ තානායම වාණිජ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම**

බළන්ගොඩ තානායම වාණිජ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම ලබාගැනීම සඳහා රත්නපුර සහකාර විගණකාධිපති මගින් සම්පත්දායකයින් හා සම්බන්ධීකරණය කර පවත්වන පුහුණු වැඩ සටහන සඳහා වියදම් වේයැයි අපේක්ෂා කරනු ලබන රු.17,000/- ක මුදල දැරීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:26 බළන්ගොඩ බස්නැවතුම්පල ් 4 දරණ කඩකාමරය :**

බළන්ගොඩ බස්නැවතුම්පල A 4 දරණ කඩකාමරයේ බදුකරු ඩී.එන්.ඒ.විජේවර්ධන වන අතර , ඔහු විසින් 2009.12.30 දිනැතිව මොහොමඩ් සනූන් මොහොමඩ් අස්කර් යන අයට කඩ කාමරය පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැව් දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පළාත් පාලන ගරු අමාත්‍යතුමන්ගේ අනුමැතියට යටත්ව 25% ක් අයකර පවරාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:27 බස්නැවතුම්පල අංකඃ ක 13ල14ල15 දරණ කඩ කාමර :**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ බස්නැවතුම්පළ අංකඃC 13,14,15 දරණ කඩ කාමර 03 කුමාරි වන්නිආරච්චි යන අය විසින් ටෙන්ඩර් මගින් ලබාගත් අතර , බදු ගිවිසුම ප්‍රමාදවීම නිසා ඔහු ආරම්භ කිරීමට බලාපොරොත්තු වූ ව්‍යාපාරය ආරම්භ කිරීමට නොහැකි බවත් මෙම කඩ කාමර සහ ජී.එච්.සුමතිපාල යන අය ලබාගත් සී

17 දරණ කඩ කාමරය බදුගත් දින සිට විවෘත කර නොමැති බවත් දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

කඩකුලී අයකරගැනීමටත් නඩු පැවරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:28 බේරුම්කරණ මධ්‍යස්ථාන නඩුව සම්බන්ධවයි**

ඉහත අංක දරණ නඩුව 2010.09.24 වන දින කැඳ වූ අවස්ථාවේ දී වැඩිදුර විභාගය සඳහා 2010.10.18 හා 2010.11.22 වන දිනයන් වලට කල් තබන ලද බැවින් , එදිනට ප්‍රථම වෘත්තිමය ගාස්තු වශයෙන් රු.30,000/- ක මුදලක් ගෙවන ලෙස ඉල්ලමින් ප්‍රසිද්ධ නොතාරිස් සහ නීතිඥ චන්ද්‍රානී දයාරත්න මහත්මිය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාළ මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:29 පොහොර අලෙවිය හා ගුණාත්මකභාවය වැඩිකිරීම :**

ජනතා පොහොර ලේකම් කාර්යාලය ( කෘෂිකර්ම අමාත්‍යාංශය ) මගින් මසකට කොම්පෝස්ට් පොහොර 100000 kg ඇණවුමක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත. එම තොගය ලබාගැනීමට පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකරන ලෙස ඉල්ලා ඇති බැවින් ඒ කෙරෙහි අවධානය යොමුකර ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

- එම තොගය මිළදී ගැනීමේ දී 1 kg ක් රු.5/- මුදලක් අයකරන ලෙස ඉල්ලීම.
- එම පොහොර ජනතා පොහොර ලෙස පැකට්කර අලෙවි කිරීම( ඒ සඳහා අවශ්‍ය බෑග් අදාළ ආයතනයෙන් සපයන බවත් දන්වා ඇත.)
- ණය සහන පදනම මත සපයා පසුව මුදල් අයකිරීම.
- සබරගමුව පළාතේ සමුපකාර සමිති සඳහා ද ණය පදනම යටතේ පොහොර සැපයීම.
- පොහොරවල ගුණාත්මක භාවය වැඩිකිරීමට පිදුරු සහ ගිලිසීඩියා එකතු කිරීමටත් , පිදුරු ලබාදෙන ගොවීන් සඳහා පිදුරු ලෝඩ් 01 ට කාබනික පොහොර 100 kg නොමිලයේ ලබාදීමටත් , ගිලිසීඩියා සපයන අයට යම් කිසි මුදලක් ලබාදීම.

ඉහත සඳහන් සියළු කරුණු එකඟව එම යෝජනා ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:30 අතුරු ව්‍යවස්ථාව - ඉරිදා සතිපොළ :**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ ඉරිදා සතිපොළ සම්බන්ධයෙන් දැනට පවතින පැරණි අතුරු ව්‍යවස්ථාවේ සතිපොළ තුළ මස් , මාළු , වියලන ලද කරවල අලෙවි කිරීම සම්පූර්ණයෙන් තහනම් යනුවෙන් වගන්තියක් පනවා ඇති ඇත. නමුත් වර්තමානයේ දී සෑම සතිපොළකම මස්,මාළු,වියලන ලද කරවල වර්ග අලෙවි කිරීම සිදුකරන හෙයින් , මස් , මාළු වියලන ලද කරවල විකිණීම සඳහා වෙනම ස්ථාන ඇතිකර බළන්ගොඩ ඉරිදා පොළ අතුරු ව්‍යවස්ථාව මස් , මාළු , වියලන ලද කරවල විකිණීමට හැකිවන පරිදි එම අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සුදුසු ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව අදාළ යෝජනාව සභා සම්මත විය.

05:31 **මහජන සෞඛ්‍යයට අදාළ බලතල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට පැවරීම :**

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරිය වු නගර සභා ආඥා පනතේ 19(4) වගන්තිය ප්‍රකාර සභාපතිවරයා වෙත පැවරී ඇති පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරනු ලබන බලතල කාර්ය හා කර්තව්‍ය හා නගර සභා ආඥා පනතේ 223 වගන්තිය ප්‍රකාරවත් පැවරී ඇති සභාපතිවරයාගේ , උපසභාපතිවරයා හා සභාව සතු මහජන සෞඛ්‍යයට අදාළ බලතල පමණක් සභාවේ හා සභාපති,උපසභාපතිවරයාගේ පාලනයට අනුමැතියට යටත්ව පවරාදීමට සලකා බැලීම සුදුසු බව එමගින් දන්වා තිබිණ.

| නිලධාරියාගේ නම | බලතල පැවරිය යුතු ක්ෂේත්‍රය | පවරන ලද බලතල |
|---|---|---|
| 01. එන්.සී.ශ්‍රී රාජ් ලියනගේ මහතා | පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක, නගර සභා බල ප්‍රදේශය | නගර සභා පනතේ 1v කොටසේ මහජන සෞඛ්‍යයට අදාළ වගන්ති. |
| 02. කේ.ඩබ්.ජ්.එන්.අයි.වීරසේකර මහතා | බළන්ගොඩ නගරය තුළ ග්‍රාම නිලධාරී වසම් | 1952 අංක දරණ පළාත් පාලන මණ්ඩල අතුරු ව්‍යවස්ථා නගර සභාව විසින් පනවා ඇති අතුරු ව්‍යවස්ථාව වල මහජන සෞඛ්‍යයට අදාළ වගන්තී |
| 03. බී.එල්.කේ.එල්.කුමාරසිංහ මහතා | බුලත්ගම ප්‍රදේශයේ නගර සභාවට අයිති ග්‍රා.නි.වසම් තුළ පමණි | |
| 04. ටී.සී.පී.ප්‍රනාන්දු මහතා | ඇල්ලෙපොල කොටසේ නගර සභාවට අයිති ග්‍රා.නි. වසම් තුළ | පීඩන ක්‍රියා ආඥා පනත ජාතික පාරිසරික පනතේ පීඩා පරීක්ෂාව හා වාර්තාකිරීම පමණක් |
| 05. ආර්.ජ්.එන්.වසන්ත මහතා | දාමහන කොටසේ නගර සභාවට අයිති ග්‍රා.නි.වසම් තුළ | නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත |
| 06. වෛද්‍ය නිමල් චන්ද්‍රසිරි මහතා | නගර සභා බලප්‍රදේශය | ජල භීතිකා රෝග ආඥා පනත සුනඛයන් එන්නත් කිරීමේ පනත සුසාන භූමි ආඥා පනත 1980 අංකඃ 26 ආහාර පනත හා නියෝග එන්නත් කිරීමේ ආඥා මහජන පැමිණිලි පරීක්ෂාව |

ඉහත සඳහන් නිලධාරීන්ට සභාවේ සභාපතිවරයාගේ හා ලේකම්වරයාගේ පාලනයට හා අනුමැතියට යටත්ව ඉහත කී බලතල පවරාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:32 බළන්ගොඩ තානායම සඳහා අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය ලබාගැනීම**

බළන්ගොඩ තානායමේ මැද මිදුල් සඳහා වහල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා අවශ්‍ය රිප්කැප්,අමානෝ ෂීට් හා අමානෝ ඇණ ලබාගැනීම වෙනුවෙන් රු.177680/- ක මුදල මුදලක් ගෙවිය යුතුවඇත. ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාල බිල්පත පියවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:33 පොදු නළ මාර්ගයක් ඉල්ලීම- මස්සැන්න පාර**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ ජාතික ජල සම්පාදන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් දිස්ත්‍රික් ඉංජිනේරු අමතමින් , මෙම සභාවේ ගරු සභාපතිතුමාට ද පිටපත් සහිතව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ මස්සැන්න පාරේ නිවැසියන් සඳහා ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.622335.28 ක වටිනාකමකින් යුතු ඇස්තමේස්තුවක් හා කිරිදිගල පලමු පටමුග පාරේ නිවැසියන් හට ජලයලබාදීම සඳහා රු.86727.23 ක වටිනාකමකින් යුතු ඇස්තමේන්තුවක් සභාවට ඉදිරිපත් කරතිබුණි.

ඉහත සඳහන් නිවැසියන් හට ජලය ලබාදීම සුදුසු යැයි ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව සභා සම්මත විය.

06. මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම්)

2010.08.17 දින සිට 2010.09.21 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

<table>
<tr><th>දිනය</th><th>විස්තරය</th><th>ව.අ.</th><th>චෙක්පත් අංකය</th><th>මුදල</th></tr>
<tr><td>2010.08.17</td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.07.01 සිට 2010.07.10 දින දක්වා ඉන්ධන බිල පියවීම
<table>
<tr><td>වර්ගය</td><td>ප්‍රමාණය</td><td>ඒකක මිළ</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>602 ලී</td><td>73.20</td><td>44066.40</td></tr>
<tr><td>එන්.ඔයිල්</td><td>02 ලී</td><td>375.00</td><td>750.00</td></tr>
<tr><td>ගියර් ඔයිල්</td><td>ලීටර්05-01</td><td>1662.00</td><td>1662.00</td></tr>
<tr><td>බ්‍රේක් ඔයිල්</td><td>01</td><td>275.00</td><td>275.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>73</td><td>115.20</td><td>8409.60</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>10</td><td>51.20</td><td>512.00</td></tr>
<tr><td>ටූ.ටී.1/2</td><td>02</td><td>180.00</td><td>360.00</td></tr>
<tr><td>ඩී.එස්.කෑන්</td><td>5 ලීටර්-02</td><td>1615.00</td><td>3230.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>59265.00</td></tr>
</table></td><td>39</td><td>192632</td><td>59265.00</td></tr>
<tr><td></td><td>මහජන බැංකුව , ආදීපාදවීදිය,විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ ගිණුම<br>2009 මාර්තු මාසයේ මාසික බිල ගෙවීම</td><td>41</td><td>192633</td><td>20846.70</td></tr>
</table>

<table>
<tr><td></td><td>සභාපති,ර/ඇල්ලෙපොල මහා විද්‍යාලීය පාසල් සංවර්ධන සමිතිය<br>පාසැල් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ මිළදී ගැනීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම 20% අත්තිකාරම් ලබාදීම</td><td>42</td><td>192634</td><td>72680.19</td></tr>
<tr><td>2010.08.17</td><td>කළමණාකරු, එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම<br>නගර සභාවේ ගලි බවුසරය අලුත්වැඩියාව වෙනුවෙන් මිළ ගණන් කැඳවීමේ පුවත්පත් දැන්වීම සඳහා</td><td>44</td><td>192636</td><td>21840.00</td></tr>
<tr><td></td><td>සරණී පික්චර් පැලස්<br>ඇල්ලෙපොල සරස්වතීවත්ත සුසාන භූමියට, කාර්යාල පරිශ්‍රයේ නඩත්තු කටයුතු හා සෞඛ්‍ය අංශයේ ප්‍රයෝජනයට අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>46</td><td>192637</td><td>11070.00</td></tr>
<tr><td></td><td>එච්.ඩබ්.ඒ.ජයරත්න<br>කාර්යාලය සඳහා අඩි 12x3 පළල කොඩි 25 සහ අඩි 20 පළල පාලම් කොඩි 02 සදහා ගෙවීම
<table>
<tr><td>වර්ගය</td><td>ප්‍රමාණය</td><td>ඒකක මිළ</td><td>වටිනාකම</td></tr>
<tr><td>පාලම් කොඩි</td><td>02</td><td>1600.00</td><td>3200.00</td></tr>
<tr><td>කොඩි</td><td>25</td><td>600.00</td><td>15000.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>18200.00</td></tr>
</table></td><td>47</td><td>192638</td><td>18200.00</td></tr>
<tr><td></td><td>ඒ.එම්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>විථි පහන් නඩත්තු කටයුතු බස්නැවතුම්පල හා අවට විදුලි නඩත්තු කටයුතු සඳහා විදුලි බල්බ ලබාගැනීම
<table>
<tr><td>වර්ගය</td><td>ප්‍රමාණය</td><td>ඒකක මිළ</td><td>වටිනාකම</td></tr>
<tr><td>23 වෝ.</td><td>80</td><td>545.00</td><td>43600.00</td></tr>
<tr><td>30 වෝ</td><td>10</td><td>585.00</td><td>5850.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>49450.00</td></tr>
</table></td><td>49</td><td>192640</td><td>49450.00</td></tr>
<tr><td>2010.08.17</td><td>පී.සී.සිස්ටම්ස්<br>ප්‍රින්ටරය සඳහා ටෝනර් 02 ලබාගැනීම
<table>
<tr><td>ප්‍රමාණය</td><td>වර්ගය</td><td>වටිනාකම</td></tr>
<tr><td>02</td><td>12 ඒ ටෝනර්</td><td>7750x2</td></tr>
<tr><td></td><td></td><td>15500.00</td></tr>
</table></td><td>50</td><td>192641</td><td>15500.00</td></tr>
<tr><td></td><td>හර්ෂන කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>51</td><td>192642</td><td>30955.26</td></tr>
<tr><td></td><td>ප්‍රසන්න කුෂන් වර්ක්ස්<br>අංකඃ56-1906 කෘෘ කැබ් රථයේ සීට් කවර මැසීම හා පිටුපස තට්ටුවේ කාපට් එක දැමීම</td><td>54</td><td>192644</td><td>10300.00</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 ජුලි මාසයේ විදුලිබිල පියවීම<br>කාර්යාලය/නගර සභාවට යාබද ගොඩනැගිල්ල</td><td>58</td><td>192648</td><td>23671.50</td></tr>
<tr><td>2010.08.18</td><td>බී.ගුණරත්න<br>2010.08.01 සිට 2010.08.15 දින දක්වා නගරයේ කැලි කසළ එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා</td><td>60</td><td>192650</td><td>100583.33</td></tr>
</table>

<table>
<tr><td></td><td>මෙට්‍රොපොලිටන් ඔපීස් පුද්.සමාගම<br>ඡායා පිටපත් යන්ත්‍රයට ටෝනර් 03 ලබාගැනීම</td><td>61</td><td>192651</td><td>7728.00</td></tr>
<tr><td>2010.08.18</td><td>මෙට්‍රොපොලිටන් ඔපීස් පුද්.සමාගම<br>එන්.පී.1215 ඡායා පිටපත් යන්ත්‍රය සේවා කිරීම සඳහා ගිවිසුම් ගාස්තු 2010.07.01 සිට 2011.06.30 දක්වා</td><td>62</td><td>192651</td><td>14000.00</td></tr>
<tr><td>2010.08.19</td><td>සුරාබදු කොමසාරිස් ජනරාල්<br>තානායම සඳහා මත්පැන් බලපත්‍රය ලබාගැනීම</td><td>63</td><td>192652</td><td>25000.00</td></tr>
<tr><td></td><td>කේම්බ්‍රිජ් ට්‍රේඩර්ස්<br>ගිනි නිවන යන්ත්‍රය සඳහා අවශ්‍ය උපාංග ලබාගැනීම</td><td>64</td><td>192653</td><td>96805.00</td></tr>
<tr><td>2010.08.19</td><td>කොලෝනියල් ඉලෙක්ට්‍රිකල්ස්<br>තානායම සඳහා අවශ්‍ය කරන ( දුම් ආදිය අවශෝෂණය කරගන්නා ) ෆෑන් එකක් ලබාගැනීම</td><td>65</td><td>192657</td><td>16200.00</td></tr>
<tr><td>2010.09.19</td><td>කෙවින් සෙරමික්ස් පුද්.සමාගම<br>තානායම සඳහා අවශ්‍ය භාණ්ඩ ලබාගැනීම
<table>
<tr><td>වර්ගය</td><td>ප්‍රමාණය</td><td>ඒකක මිළ</td><td>වටිනාකම</td></tr>
<tr><td>Towel Bar</td><td>02</td><td>1700.00</td><td>3400.00</td></tr>
<tr><td>B' Spray</td><td>03</td><td>450.00</td><td>1350.00</td></tr>
<tr><td>Puper Holder</td><td>02</td><td>750.00</td><td>1500.00</td></tr>
<tr><td>Mirror L</td><td>02</td><td>950.00</td><td>1900.00</td></tr>
<tr><td>Mirror H</td><td>04</td><td>3250.00</td><td>13000.00</td></tr>
<tr><td>Single Soif</td><td>02</td><td>800.00</td><td>1600.00</td></tr>
<tr><td>Shower</td><td>02</td><td>1500.00</td><td>3000.00</td></tr>
<tr><td>Sink Bowl Set</td><td>01</td><td>9500.00</td><td>9500.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>37250.00</td></tr>
</table></td><td>66</td><td>192655</td><td>37250.00</td></tr>
<tr><td>2010.08.23</td><td>පී.ඒ.පුෂ්පා රංජනී<br>නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව බලන්ගොඩ නව බස්නැවතුම්පලට ගෙන යාම වෙනුවෙන් නාම පුවරුව භාෂා තුනෙන් පුවරු 02 ක් ඉදිකිරීම</td><td>67</td><td>192656</td><td>14550.00</td></tr>
<tr><td>2010.08.23</td><td>හර්ෂණ කලර් සෙන්ටර්<br>කාර්යාලයේ පොළව පොලිෂ් කිරීම හා තානායමේ තීන්ත ආලේප කිරීම</td><td>70</td><td>192659</td><td>15092.98</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය 2010.07.12 සිට 2010.07.16 දින දක්වා ඉන්ධන බිල පියවීම
<table>
<tr><td>වර්ගය</td><td>ප්‍රමාණය</td><td>ඒකක මිළ</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>805</td><td>73.20</td><td>58926.00</td></tr>
<tr><td>එන්.ඔයිල්</td><td>01</td><td>292.00</td><td>292.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>43</td><td>115.20</td><td>4953.60</td></tr>
<tr><td>ටූ.ටී.1/2</td><td>01</td><td>180.00</td><td>180.00</td></tr>
<tr><td>හයිඩ්‍රොලික් 40 ලී කෑන්</td><td>01</td><td>11210.00</td><td>11210.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>45561.60</td></tr>
</table></td><td>71</td><td>192660</td><td>75561.60</td></tr>
<tr><td>2010.08.23</td><td>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>2010 අප්‍රේල් මැයි හා ජුනි මාස වලට අදාළව ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස්</td><td>72</td><td>192661</td><td>91209.65</td></tr>
</table>

<table>
<tr><td></td><td>වෙත යැවීම</td><td></td><td></td><td></td></tr>
<tr><td>2010.08.23</td><td>එල්.ඒ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් ලබාගැනීම
<table>
<tr><td>වර්ගය</td><td>එකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>4x4</td><td>4000/-</td><td>01</td><td>4000.00</td></tr>
<tr><td>½</td><td>3300/-</td><td>02</td><td>6600.00</td></tr>
<tr><td>1 ½</td><td>4400/-</td><td>03</td><td>13200.00</td></tr>
<tr><td>6x9</td><td>2300/-</td><td>05</td><td>11500.00</td></tr>
